# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2311/31 - 2022 දෙසැම්බර් මස 21 වැනි බදාදා - 2022.12.21

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී )

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

**බස්නාහිර පළාතේ පළාත් සභාව**

1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු සුසාන භූමි හා මිනීපිටි පිළිබඳ ආඥාපනතේ 5 වන වගන්තිය යටතේ කරනු ලබන නිවේදනයයි

අගලවත්ත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අදාළව සුසාන භූමි හා මිනීපිටි පිළිබඳ ආඥපනතේ 03 වන වගන්තිය යටතේ නිසි බලධරයා වන අගලවත්ත ප්‍රාදේශීය සභාවේ නිර්දේශය මත, 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික) විධිවිධාන පනතේ 02 වන වගන්තිය සමග කියවිය යුතු ඉහත කී ආඥපනතේ 5 වන වගන්තියෙන්, බස්නාහිර පළාතේ ආණ්ඩුකාරවර වශයෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති ඉඩම මළවුන් වැළලීම හෝ ආදහනය කිරීම පිණිස වෙන් කරන ලද පොදු සුසාන භූමියක් වශයෙන් භාවිතා කිරීමට මෙයින් නියම කරමි.

**රොෂාන් ගුණතිලක,**
ආර්ඩබ්පී ඇන්ඩ් බාර් වීඑස්වී යූඑස්පී
පීඑච්ඩී එෆ්අයිඑම් (ශ්‍රී ලංකා) එන්ඩීසී පීඑස්සී,
මාර්ෂල් ඔෆ් ද ශ්‍රී ලංකා එයාර් ෆෝස්,
ආණ්ඩුකාරවර,
බස්නාහිර පළාත.

2022 නොවැම්බර් මස 16 වැනි දින,
අංක 204,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ලේ,
පළාත් සභා ගොඩනැගිල්ලේ දී ය.

1A - PG 6114 — 08 (2022/12)

මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

### උපලේඛනය

**බේරගම පල්ලියවත්ත සුසාන භූමිය**

කළුතර දිස්ත්‍රික් මිනින්දෝරු අධිකාරි විසින් මැන සකස් කරන ලද මු.පි.ක 4066 දරන 2008.04.28 දිනැති මානක පිඹුරෙහි ;

3 වෙනි කැබැල්ල

| | |
|---|---|
| උතුරට | : 2 වැනි කැබැල්ල |
| දකුණට | : රජය හිමිකම් කියන පල්ලියවත්ත (මු.පි.ක. 1744 පිඹුරේ 1 වෙනි කැබැල්ල), බී. ඩී. දෙරේනිස් සහ තවත් අය හිමිකම් කියන නරාවල කුඹුර සහ මාර්ගය. |
| නැගෙනහිරට | : දෙවෙනි කැබැල්ල, රජය හිමිකම් කියන පල්ලියවත්ත, (මු.පි.ක. 1744 පිඹුරේ 1 වෙනි කැබැල්ල) බී. ඩී. දෙරේනිස් සහ තවත් අය හිමිකම් කියන නරාවල කුඹුර. |
| බස්නාහිරට | : මාර්ගය සහ දෙවෙනි කැබැල්ල. |

4 වෙනි කැබැල්ල

| | |
|---|---|
| උතුරට | : රජය හිමිකම් කියන පල්ලියවත්ත (මු.පි.ක. 1744 පිඹුරේ 1 වෙනි කැබැල්ල), බී. ඩී. දෙරේනිස් සහ තවත් අය හිමිකම් කියන නරාවල කුඹුර |
| දකුණට | : රජය හිමිකම් කියන පල්ලියවත්ත (මු.පි.ක. 1744 පිඹුරේ 1 වෙනි කැබැල්ල) සහ දෙවෙනි කැබැල්ල. |
| නැගෙනහිරට | : බී. ඩී. දෙරේනිස් සහ තවත් අය හිමිකම් කියන නරාවල කුඹුර සහ රජය හිමිකම් කියන පල්ලියවත්ත (මු.පි.ක. 1744 පිඹුරේ 1 වෙනි කැබැල්ල). |
| බස්නාහිරට | : දෙවෙනි කැබැල්ල සහ රජය හිමිකම් කියන පල්ලියවත්ත (මු.පි.ක. 1744 පිඹුරේ 1 වෙනි කැබැල්ල), |

එකී කැබලි අංක 3, 4 දරන කොටස ''බේරගම පල්ලියවත්ත සුසාන භූමිය'' වශයෙන් පෙන්නුම් කරයි.

EOG 12-0275

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.